## ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව
---------------------------------------
## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
-----------------------------

### 1. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 නොවැම්බර් 12 දින ද ඉකත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 11 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල විගණකාධිපතවරයාගේ වාර්තාව 2015 පෙබරවාරි 23 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 මතය
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ගෝමරන්කඩවල ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණයන් කරණු ලැබේ

**(අ)** කඩ කාමර කලී ලේඛනය අනුව 2013 දෙසැම්බර් 31 දිනට රු. 63,280 ක් වූ ලැබියයුතු කඩ කාමර කුලී ශේෂය රු. 76,100 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් කඩ කාමර කුලී රු. 12,820 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

**(ආ)** පුරනැගුම ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය වූ රු. 1,603,256 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව ලද රු. 411,520 ක් වූ ස්ථාවර තැන්පතු පොලී ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 ලැබිය යුතු ගිණුම්

වර්ෂ 02 සිට වර්ෂ 03 ක් දක්වා වූ කාල පරිච්ඡේදයකට අයත් එකතුව රු. 63,280 ක් වූ ලැබිය යුතු කඩ කාමර කුලී අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

පහත සඳහන් ගිණුම් විෂයන්ට ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිකම නිසා එම විෂයයන් විගණනයේදි සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පරීක්ෂා කිරීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම (රු) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ස්ථාවර වත්කම් | 7,487,441 | ස්ථාවර වත්කම් ලේඛනය |
| ගෙවිය යුතු ගිණුම් | 76,100 | ශේෂ සනාථ ලිපි ,කාලවිශ්ලේෂණ වාර්තා , විස්තරාත්මක උපලේඛනය |

### 1.3.4 නීති,රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති , රෙගුලාසි සහ විධි විධානවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1989 අප්‍රේල් 17 දින අංක 554/ 5 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 59 වැනි රීතිය. | සභා බල ප්‍රදේශයට අයත් ව්‍යාපාර ආයතන පිළිබඳ සමීක්ෂණයක් විගණිත දිනය වූ 2015 ජනවාරි 01 දින වන විට ද සිදු කර නොතිබුණි. |
| (ආ) | පලාත් පාලන, පලාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කල යුතු වුවද, සභාව සතු වාහන 04 සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 224,055 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 132,940 ක් විය.

පසුගිය වර්ෂයට සාපේක්ෂව වෙනත් ආදායම් ලැබීම් රු. 194,112 කින් වැඩි වීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 91,115 කින් වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | 2013දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | - | 48 | - |
| බදු කුලී | 827 | 527 | 300 |
| බලපත්‍ර ගාස්තු | 50 | 57 | - |
| වෙනත් ආදායම් | 1,201 | 1,232 | - |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

**භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම.**

2014 ජනවාරි 28 දින පැවැත් වූ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව භාණ්ඩ වර්ග 03 ක් අළුත්වැඩියා කිරීමටත් , භාණ්ඩ වර්ග 11 ක් ඉවත් කිරීමටත් , භාණ්ඩ වර්ග 37 ක් විනාශ කිරීමටත් නිර්දේශ කර තිබුණත් විගණිත දිනය වූ 2015 ජනවාරි 01 දින වන විට ද ඒ සඳහා අවශ්‍යය කටයුතු ගෙන නොතිබුණි.

3.2 **කොන්ත්‍රාත් පරිපාලනය**

-----------------------------

ගෝමරන්කඩවල ප්‍රාදේශීය බල ප්‍රදේශය තුල පවත්නා උග්‍ර පානීය ජල හිඟයට විසඳුමක් වශයෙන් පුර නැගුම ව්‍යාපෘතිය යටතේ පානීය ජල ව්‍යාපෘතියක් අදියර තුනක් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා සභාව විසින් රු. 50,170,730 ක් වටිනා ගිවිසුම් තුනක් අත්සන් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ පවුල් 300 ක් සඳහා සිදු කර තිබූ ජලනල එලීමේ ඉදිකිරීම් කටයුතු ගිවිසුම් ප්‍රකාරව 2013 දෙසැම්බර් 07 දින වන විට අවසන් කළ යුතු වුවද , විගණිත දිනය වූ 2015 ජනවාරි 01 දින වන විටද එම කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) සෞඛ්‍ය ආරක්ෂිත පානීය ජලය නොමැති වීම හේතුවෙන් මේ වන විට ගෝමරන්කඩවල ප්‍රාදේශීය බල පදේශය තුල පමණක් වකුගඩු රෝගීන් 108 ක් වාර්තා වී ඇති අතර දැනට රු. මිලියන 34 ක් වැය කර තිබූ මෙම පානීය ජල ව්‍යාපෘතියෙන් කිසිදු නිවසකට මේ දක්වා පානය ජලය ලබා දීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2005 අංක 03 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර (2007 අංක 13 හා 2009 අංක 18 දරන මුදල් සංශෝධන පනත්වලින් කරනු ලබන සංශෝධනවලට යටත්ව) ව්‍යාපෘතියේ පළමු අදියර හා දෙවන අදියර වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබූ රු. 25,484,622 ට අදාල කර්මාන්ත සහතික අරමුදල් බද්ද (CIGFL) වන රු. 63,712 ක් රඳවාගෙන දේශීය ආදායම් කොමසාරිස්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

3.3 **අයවැය පාලනය**

---------------------

සමාලෝචිත වර්ෂයේ තත්‍ය වියදම සහ අයවැය ප්‍රතිපාදන සියයට 02 සිට සියයට 70 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි. ඒ අනුව වාර්ෂික අයවැය විධිමත් මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

4. **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක මට්ටම | 01 | - | 01 |
| ද්විතික මට්ටම | 15 | 06 | 09 |
| තෘතීය මට්ටම | 15 | 06 | 09 |
| **එකතුව** | 31 | 12 | 19 |

පහත **සඳහන්** කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ)** 2014 ජුනි මස සිට පුරප්පාඩුව පවතින ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුර සඳහා සුදුසු පුද්ගලයකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** සංවර්ධන නිලධාරි , රියදුරු , යන්ත්‍ර ක්‍රියාකරු සහ වැඩ පරීක්ෂක තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**(අ)** ගිණුම්කරණය

**(ආ)** ආදායම් පරිපාලනය

**(ඇ)** ස්ථාවර වත්කම් පාලනය

**(ඈ)** කොන්ත්‍රාත් පරිපාලනය

**(ඉ)** මානව සම්පත් කළමනාකරණය

**(ඊ)** අයවැය පාලනය